# 60 දශකයේ ග්‍රාමීය විශ්‍රාන්තියඃ සියනෑ කෝරලේ අත්දැකීම්

එම්.බී.ටී. නයෝමාලි

ලංකාව සුද්දාගෙන් රට බාර ගෙන කරන්නට පටන් ගෙන හරියටම දශක දෙකක් පමණක් ඉක්ම යන තැන ලාංකික ජන සමාජය තුළ ඉතිරිව තිබූ ගැමි කම හා සුද්දා අතැර ගිය සුන්බුන් සමග ජීවිතය ගැටගසා ගෙන යන සියනෑ කෝරලේ ගැමියන් අතරම බිහි වූ සිත්තරෙකු බහ තේරෙන අවධියේ සිට ලබන අද්දැකීම් හා ඔහුගේ වීරයා දිවියෙන් සමුගැන්ම දක්වා ගෙතුනු ජීවිත අන්දරය "තුන්මන් හන්දිය" නැමති නවකතාව තුළ මහගම සේකරයන් ගොඩනන්වනු ලබන්නේ පිටු 112 ක් උපයුක්ත කර ගෙනය.

පුංචි දවස්වල බබාට ලිංග භේදයක් නැත...බබා ලොකු වු විට ගැහැනියක් නම් බබා නෝනා වේ. පිරිමියෙක් නම් බබා සිංඤෝ වේ....කන්නට බොහෝ දේවල් මග දිගට තිබේ දං, කැකිල්ල, බිං පොල්, කටු අන්නාසි....ගහේ පංචාංගයම කති.....ඇරත් බලා සිටීමට බොහෝ දේවල් පාරේ සිදුවේ කාර් රෝදවල හුළං යයි. ගල් මෝල ඇවිත් පාර තලයි.....අපි වටවී සුදු පාටින් පිපුණු පැල පී දෙස කෙල ගිල ගිල බලා සිටිමු. ඇත ඉඳගෙන පොල් ගොඩේ ලොකු පැල පී තිබිය හැකි ගෙඩි තෝරමු. අපි ඒ පොලය පලන තුරු දිනන්නට බලා සිටිමු.....මුදුන්පිට කන්දට පැමිණි පසු...කන්ද මුදුනේ සිට පාර මැද එකම තැනට මූත්‍රා කිරීමයි...බැරි වෙලාවත් මූත්‍රා පාර ඇදට ගියොත් එය කෝටු කැල්ලකින් නිසි මගට යොමු කරවීමට පුළුවන....මා බිත්ති දිගටත් දොර පළුවලත් අඟුරුවලින් ඇඳ ඇති....කොල්ලෝ ගල් අමුණට නැගී කරනම් ගසමින් දියට පනිති දිය යටින් පීනා ගොස් ඈතින් මතු වෙති, ඔට්ටු දෙති, වතුර ගසා ගනිති....පාට පාට කුරුලු පිහාටු නියර උඩ වැටී තිබේ නැවති ඒවා අහුලමින්....මාලු පැටියෙක් දෙන්නෙක් අල්ලා හෝර්ලික්ස් බෝලලයේ දමා ඇති කිරීමට....මිස්ටෙත්, වර්ලියනුත් දෙන්නා නම් උදේ සිට රෑ වන තුරුම කඩපිලේ ඉඳගෙන දාං අදිති.....පත්තරෙන් ඉරාගත් පින්තූර මත ඉටිපන්දම් කිරි ගා ඒ පින්තූර ඇක්සයිස් කොලවලට ගනිමි....මා සරුංගලය අරගෙන දුවන විට එය කැරකෙන හැටි මාමා බලා සිටී....මාමා හදන සරුංගල් උක්කුවා හදන සරුංගල් මෙන් කූරුයා ගසන්නේ නැත....අඳුර වැටීගෙන එන විට නිකුලස් මාස්ටරුත්, මාර්ටින් ප්‍රේරාත්, තව තබ්ලා කාරයෙකුත් පැමිණියහ.....අයිසේ නැමී...බම්බු නැටුමක් නටයි.....ඉඳා වැල් ටික කා ඉවර වු පසු ඌ මට බොරුවට අනින්නට හදයි....අපි චක්කුඩු පනිමු. යුද්ද කරමු. ඔට්ටු දුවමු. ඇල්බට් ටයර් එක තුළට රිංගා ගුලි ගැසී සිටින විට උක්කුං එය තල්ලු කරගෙන දුවයි....අපි හෙළුවෙන් දියට පනිමු....කොයි තරම් හොඳට ඇඹුවත් කිරිමිටියෙන්.....කොළපොන් ගැසීමට නිච්චියටම සිදුවන්නේ අපටය...අපි මැඩුවන් කන්දේම ඇලවී අහස දිහා බලා සිටිමු.......සල් පිල අවසානයේ සඳකිඳුරු ජාතක නාට්‍ය අත්‍යාලංකාරයෙන් රඟ දක්වනු.....ඉටි පන්දම් පත්තු කර ඉබ්බන්ගේ පිටේ ගසා උන් දියට තල්ලු කරමු.....බණ කියන විට නිදි වැටෙමින් උන් අය පවා සල්පිල පටන් ගන්නා විට උද්යෝගිමත් වෙති.....උක්කුනුත්, ඇල්බටුත්, කෝලන් වෙස්මූණු බැඳගෙන කොළ අතු ඇඳගෙන ඇගපතේ දැලි තවරාගෙන වැද්දන් මෙන් නටනටා....නරඹන්නෝ හූ කියති, සිනා සෙති, පඩි පෙළ උඩට වී නැටුම් බලන පොඩි හාමුදුරුවොන්ට පවා එවිට සිනාව නවතා ගන්නට බැරිය...ගෙවල් මිදුල් අතුගා ගේ දොර පිරිසිදුවට තියා ගනියි. දොර රෙදි ජනෙල් රෙදි දමයි. මිදුලේ මල් වවයි.....බයිස්කෝප් බලන්න කාර් එකෙන් කොළඹ යයි. මීගමුව ගිහින් රා බී මාලු අරන් එයි. පොසොන් පෝයට අනුරාධපුරෙත් මැදින් පෝයට සිරීපාදෙත් යයි.....ගමනට බක්කි කරත්ත 14 ක් තිබුණි. මනමාලිත් මනමාලයත් නැංගේ අන්තිමට තිබූ බක්කි කරත්තයටය.... බලි අඹන හැටි බලා ඉන්නට ආස හිතේ. රූප අඹන හැටි, පාට ගාන හැටි, හබරල කොල වලින් ගොක්කොල වලින් කැටයම් කපන හැටි මටත් වඩා ආසාවෙන් මාමා බලා සිටී.....සතියකට වරක් පොත බැගින් ගෙදර ගෙන ගොස් කියවමි. ආරෝන් රබාන ගැසු අතර මම විරිඳු කීමි. කල එළි මඩු නටන දාට නාටකය නැරබීමට....තමාගේ නළුවා වේදිකාවට පැමිණි විට අත්පොලසන් දීමෙන්ද, සියුරු හඬලෑමෙන් ද, ඔහු පිළිගනිති. සුහුඹුල් බුලත් වැල් පහුරු අල්ලා කොවුල් දිගේ ඉහලට ඇදෙන විට තාත්තා ඒ දෙස බලා සිටින්නේ අපමණ සතුටකිනි......

1960 දශකය වන විටත්, පැවති සරල ග්‍රාමීය ජීවන රටාවත්, විශ්‍රාන්තිමය සුවය යන්න දෙකක් නොව එකක්ම වන බව අධ්‍යයනයට මෙම කෘතිය පෙරවදනක් වනු නොඅනුමානය.

මහගම සේකර, තුන්මන් හන්දිය, ප්‍රථම මද්‍රණය 1967. 26 වන මුද්‍රණය 2016. එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද එස්. කුලරත්න මාවත, කොළඹ 10.